**'ප්‍රාථමික - අර්ධ ශිල්පීය' සේවා ගණය සඳහා දෛනික වැටුප් ගෙවීමේ පදනම මත සේවකයින් ලියාපදිංචි කර ගැනීම**

දික්වැල්ල ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින පහත සඳහන් තනතුර සඳහා සේවා අවශ්‍යතාවය හේතුවෙන් දෛනික වැටුප් ගෙවීමේ පදනම මත ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- **විදුලි කාර්මික තනතුරු 01** - මෙම තනතුරට පහත සඳහන් **අධ්‍යාපන සුදුසුකම්** සපුරාලිය යුතුය.

i අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හය (06) ක් සමත් වී තිබිය යුතුය.

Ii අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම.

Iii අදාළ ක්ෂේත්‍රෙය් පළපුරුද්ද අමතර සුදුසුකමකි.

හෝ

ඉහත i හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් නොමැති විට

Iv ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ 3) මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම.

v. අදාළ ක්ෂේත්‍රෙය් පළපුරුද්ද අමතර සුදුසුකමකි.

උක්ත තනතුර සඳහා අනෙකුත් සුදුසුකම් පහත පරිදි විය යුතුය.

**කායික සුදුසුකම්** : දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**වෙනත් සුදුසුකම්** :

1) ශ්‍රී ලංකා පුරවැසියකු වීම.

2) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

3) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. පදිංචි ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශිය ලේකම් විසින් අනු අත්සන් කර, නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය.

4) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**වයසස** : අවම සීමාව : අවුරුදු 18
උපරිම සීමාව : අවුරුදු 45

**බඳවා ගැනීමේ ක්‍රමය** : (1) මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යවහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරේ. මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලැබූ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ. (මෙය තීරණය වන්නේ ලැබෙන අයදුම්පත් ප්‍රමාණය මතය.)

(2) මෙය සේවා අවශ්‍යතාවය මත සිදු කරනු ලබන ලියාපදිංචි කර ගැනීමකි.

(3) රා.ප.ච. 10/2025 අනුව PL 2 තනතුරට අදාළව දෛනික වැටුප් ගෙවීමේ පදනම මත ලියාපදිංචි කර ගැනීම.

**අයදුම්පත් එවිය යුතු ආකාරය** : මේ සමග සඳහන් කර ඇති අයදුම්පත අනුව ඔබ විසින් A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතා කර සකස් කර ගත් අයදුම්පත් 2026 ජූනි මස 25 දිනට ප්‍රථම ලියාපදිංචි තැපැල මගින් හෝ සතියේ වැඩ කරන දිනක පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා භාර දී, භාර දුන් බවට කුවිතාන්සියක් ලබා ගන්නා ලෙසත්, ලිපි කවරයේ වම් පස ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කර එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

**අයදුම්පත සමග එවිය යුතු ලේඛන** : උප්පැන්න සහතිකයේ පිටපතක්/ ජාතික හැඳුණුම්පතෙහි පිටපතක්/ අධ්‍යාපන සහතිකවල පිටපත්/පදිංචි සහතිකයේ පිටපතක්/වෘත්තිය සුදුසුකම් සහිත සහතිකයේ පිටපතක්/පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්

සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

මේ සම්බන්ධයෙන් අවසන් තීරණ ලබා ගැනීම ප්‍රාදේශීය සභා සභාපතිගේ තීරණය මත වෙනස් විය හැකිය.

රුවන් වික්‍රමආරච්චි,
සභාපති,
දික්වැල්ල ප්‍රාදේශීය සභාව.

දිනය : 2026.06.10 දින.

**........................................................................ තනතුර සඳහා ලියාපදිංචි කර ගැනීමේ අයදුම්පත්‍රය**

01. සම්පූර්ණ නම : ..........................................................................

02. මුලකුරු සමග නම : ..........................................................................

03. ජාතිය : ..........................................................................

04. පුද්ගලික ලිපිනය : ..........................................................................

..........................................................................

05. දුරකතන අංකය : ..........................................................................

06. උපන් දිනය : ..........................................................................

07. ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................

08. අධ්‍යාපන සුදුසුකම් : ..........................................................................

..........................................................................

..........................................................................

..........................................................................

09. වෘත්තිය සුදුසුකම් : ..........................................................................

10. වෙනත් සුදුසුකම් : ..........................................................................

11. පළපුරුද්ද : ..........................................................................

මා විසින් සඳහන් කරන ලද සත්‍ය හා නිවැරදි බවටත්, සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර නොමැති බවටත් සහතික කරමි.

දිනය : 202.....................

....................................................
අයදුම්කරුගේ /අයදුම්කාරියගේ අත්සන.

**……………………………………………………………… තනතුර සඳහා ලියාපදිංචි කර ගැනීමේ අයදුම්පත්‍රය**

01. සම්පූර්ණ නම : ………………………………………………………………………

02. මුලකුරු සමග නම : ………………………………………………………………………

03. ජාතිය : ………………………………………………………………………

04. පුද්ගලික ලිපිනය : ………………………………………………………………………

………………………………………………………………………

05. දුරකතන අංකය : ………………………………………………………………………

06. උපන් දිනය : ………………………………………………………………………

07. ජාතික හැඳුනුම්පත් අංකය : ………………………………………………………………………

08. අධ්‍යාපන සුදුසුකම් : ………………………………………………………………………

………………………………………………………………………

………………………………………………………………………

………………………………………………………………………

09. වෘත්තිය සුදුසුකම් : ………………………………………………………………………

10. වෙනත් සුදුසුකම් : ………………………………………………………………………

11. පළපුරුද්ද : ………………………………………………………………………

මා විසින් සඳහන් කරන ලද සත්‍ය හා නිවැරදි බවටත්, සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර නොමැති බවටත් සහතික කරමි.

දිනය : 202………………… ………………………………………………

අයදුම්කරුගේ /අයදුම්කාරියගේ අත්සන.